# මිනුවන්ගොඩ අධ්‍යාපන කලාපය

## දෙවන වාර පරීක්ෂණය - 2018

**නාට්‍ය හා රංග කලාව** | **6 ශ්‍රේණිය** | කාලය පැය දෙකයි

### I කොටස

- **ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න.**

1. ජන කතාවක් නොවන්නේ,
   i. හීල්බත් දංකුඩ ය.
   ii. බුදුන් වඳින ලෙස වැඳපන් අම්මාට ය.
   iii. අනුන්ට කැපූ වලේ තමන් වැටීම ය.
   iv. දික්තලා කාලගෝල ය.

2. වෙනත් අයෙකුගේ ක්‍රියාවන් ඒ ආකාරයෙන් ම කිරීම
   i. අභිනය නම් වේ.
   ii. අනුකරණය නම් වේ.
   iii. අභිරූපණ නම් වේ.
   iv. රූපණය නම් වේ.

3. අභිනය ප්‍රභේද
   i. 2 කි
   ii. 3 කි
   iii. 4 කි
   iv. 5 කි

4. ළමා නාට්‍ය පමණක් ඇතුළත් වරණය වන්නේ
   i. පුංචි අපට දූන් තේරෙයි, නෙළුම් කුමාරි, තොප්පි වෙළෙන්ද
   ii. තොප්පි වෙළෙන්ද, මනමේ, පුංචි අපට දූන් තේරෙයි
   iii. පුංචි අපට දූන් තේරෙයි, රතු හැට්ටකාරි, මනමේ
   iv. නෙළුම් කුමාරි, රතු හැට්ටකාරි, තොප්පි වෙළෙන්ද

5. හිඟන්නාගේ සැරයටිය යනු
   i. රංගාභරණය කි
   ii. නාට්‍යෝපකරණය කි
   iii. රංග වස්ත්‍රය කි
   iv. පසුතල නිර්මාණය කි

- **අංක 6 - 10 දක්වා ප්‍රශ්න වලට ගැළපෙන පිළිතුර යා කරන්න.**

| A | B |
|---|---|
| 6. මුහුණින් හැඟීම් ප්‍රකාශ කිරීම | ▪ ප්‍රේක්ෂකයා ය |
| 7. නාට්‍ය ගීතයකි | ▪ අභිරූපණ |
| 8. ළමා චිත්‍රපට | ▪ සාත්වික අභිනය |
| 9. වාචික අභිනය භාවිත නොවේ | ▪ සිරි රජ සිරි |
| 10. නාට්‍ය නරඹන්නා | ▪ කුමටද සොබනියෙ |

- **11 - 15 දක්වා ප්‍රශ්න වලට හරි නම් (✓) ලකුණ ද වැරදි නම් (×) ලකුණ ද යොදන්න.**

11. නාට්‍යයක් රඟ දක්වන ස්ථානය රංගභූමිය නොවේ. ( )
12. "අබරං සිල් ගත්තා වගේ" ප්‍රසිද්ධ ළමා නාට්‍යයකි. ( )
13. "ලේන්සු හැංගීම" ජන ක්‍රීඩාවකි. ( )
14. රංගනයේදී සිරුර හා මනස අතර මනා සබඳතාවක් අත්‍යවශ්‍ය නොවේ. ( )
15. රංගාභරණ නිර්මාණයේ දී විශාල මුදලක් වැය කළ යුතු ය. ( )

- **16 - 20 දක්වා වගන්ති වලට සුදුසු වචනය වරහන් තුළින් තෝරා හිස්තැන මත ලියන්න.**

16. හඬ පාලනය කර ගැනීම සඳහා ............................ වල නිරත වීම වැදගත් ය.
17. මිනිස් ජීවිතය යහමඟට යොමු කරන ග්‍රන්ථයක් ලෙස ............................ හඳුනාගත හැකි ය.
18. ............................ චරිත ලෙස දෙවියන්, යෝධයන්, භූතයන් සඳහන් කළ හැකි ය.
19. නාට්‍ය කලාව ............................ මෙන්ම සජීවී කලාව කි.
20. දයානන්ද ගුණවර්ධන මහතාගේ ............................ නාට්‍ය ප්‍රසිද්ධ වේදිකා නාට්‍යය කි.

**(සාමුහික/ කටහඬ අභ්‍යාස/ නරිබෑණා/ සිරිත් මල්දම/ අධිමානුෂීය)**

(ලකුණු 20)

## II කොටස

- **පළමු ප්‍රශ්නය අනිවාර්ය වේ. තවත් ප්‍රශ්න 2කට පිළිතුරු සපයන්න.**
- **පිළිතුරු ලිවිය යුතු මුළු ප්‍රශ්න සංඛ්‍යාව තුනකි.**

1.

    i. අභිනය යන්න නිර්වචනය කරන්න. (ලකුණු 2)

    ii. අභිනය කොටස් නම් කරන්න. (ලකුණු 4)

    iii. ඔබ නැරඹූ නාට්‍යයක සතර අභිනය යොදා ගෙන ඇති ආකාරය කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 4)

2. "තමන් පණ ලෙස හැම - සතුන් ගැන සලකා පෙම
ඔවුන් දුටු විලසට - කරන් ආදර ගුණය නොහැරම"

    i. ඉහත සඳහන් කවිය ඇතුලත් ග්‍රන්ථය කුමක්ද? (ලකුණු 2)

    ii. එහි කතුවරයා කවුද? (ලකුණු 4)

    iii. මෙම කවියේ අදහසට ගැළපෙන පරිදි නාට්‍යෝචිත අවස්ථාවක් ගොඩ නගන්න. (ලකුණු 4)

3.

    i. ඔබ දන්නා ළමා නාට්‍ය තුනක නම් ලියන්න. (ලකුණු 5)

    ii. ඔබ වඩා කැමති නාට්‍ය ගීයක් සම්පූර්ණයෙන් ලියන්න. (ලකුණු 5)

4. ඔබ අසා ඇති "කපුටා සහ කේප්පු කැල්ල" කතාන්දරය ඔබට කැමති පරිදි වෙනස් කරමින් කතාවක් ලෙස රසවත්ව රචනා කරන්න. (ලකුණු 10)